Student/Registration Number | | | | | | | | | | | Centre Number | | | | | | |

## 2007 PUBLIC EXAMINATION

# Sinhala

## Continuers Level

**Thursday 18 October: 2 p.m. Eastern Standard Time**

Reading Time: 10 minutes
Working Time: 2 hours and 50 minutes

- *You have 10 minutes to read all the papers and to familiarise yourself with the requirements of the questions. You must not write during this time.*
- *Monolingual and/or bilingual printed dictionaries may be consulted during the reading time and also during the examination.*

## Section 1: Listening and Responding (30 marks)

**Instructions to Students**

1. Allow approximately 50 minutes for Section 1.
2. Write all your answers to the questions in Section 1 in this booklet in blue or black ink or ball-point pen. Space is provided for you to make notes.
3. You must answer ALL questions in Part A and Part B.
4. Answer Part A in ENGLISH and Part B in SINHALA.
5. Write your student/registration number and the centre number (if required) on the front cover of this booklet.
6. All question booklets will be collected at the end of the examination.

*This examination is used for the HSC (New South Wales), the NTCE (Northern Territory), the SACE (South Australia), the TCE (Tasmania), the VCE (Victoria), and the WACE (Western Australia).*

© Victorian Curriculum and Assessment Authority 2007

**Part A** (Questions 1–3)
(20 marks)

---

*When judging performance in this part, the examiner(s) will take into account the extent to which the student demonstrates the capacity to:*

- *understand general and specific aspects of texts by identifying and analysing information and convey the information accurately and appropriately.*

---

You will hear THREE texts. Each text will be played twice. There will be a short break between the first and second playings in which you may make notes.

Listen carefully to each text and then answer the questions in ENGLISH.

**Marks** | You may make notes in this space.

**Text 1**

1. (a) Identify who could benefit from this advertisement. **2**

(b) Explain how they may benefit. **1**

(c) Describe the main features of this CD. **2**

Marks | You may make notes in this space.

**Text 2**

2. (a) Why is this day important for Namal Uyana? **1**

(b) Explain the role of Venerable Rahula with regard to Namal Uyana. **1**

(c) What is the significance of the Na tree to Sri Lanka? **1**

(d) According to the text, what evidence is there to show that pink quartz has been in use for a long time? **2**

Marks | You may make notes in this space.

**Text 3**

3. (a) What are the reasons for the **rise** in paddy cultivation in early Sri Lanka and its **fall** prior to 1940? **3**

(b) What measures were taken to support paddy cultivation after 1940? **3**

(c) What are the suggestions made by Mr Bandara? **4**

**Part B** (Questions 4–5)
(10 marks)

---

*When judging performance in this part, the examiner(s) will take into account the extent to which the student demonstrates the capacity to:*

- *understand general and specific aspects of texts by identifying and analysing information;*
- *convey the information accurately and appropriately.*

---

You will hear TWO texts, one relating to Question 4 and one relating to Question 5. Each text will be played twice. There will be a short break between the first and second playings in which you may make notes.

Listen carefully to each text and then answer the questions in SINHALA.

**Marks** | You may make notes in this space.

**Text 4**

4. (a) Why was Chitrasena a role model for Sri Lankan artists? **2**

චිත්‍රසේන ශ්‍රී ලංකාවේ කලාකරුවන්ට ආදර්ශමත් චරිතයක් වන්නේ කෙසේද?

________________________________________

________________________________________

________________________________________

(b) Explain how Chitrasena’s skills were recognised by Sri Lanka. **2**

චිත්‍රසේනගේ දක්ෂතාවයන් ශ්‍රී ලංකාව අගය කළ අන්දම පැහැදිලි කරන්න.

________________________________________

________________________________________

________________________________________

Marks | You may make notes in this space.

**Text 5**

5. (a) What Sinhala New Year traditions are mentioned in the text? **3**

මෙම පාඨයේ සඳහන්වන සිංහල අලුත් අවුරුදු චාරිත්‍ර මොනවාද?

(b) What prevented the brother from celebrating Sinhala New Year? **1**

සහෝදරයාව සිංහල අවුරුදු සිරිත් පිළිපැදීමෙන් වැළැක්වූ කරුණ කුමක්ද?

(c) Identify two expressions used by the sister to show her feelings. **2**

සහෝදරිය තම හැඟීම් ප්‍රකාශ කිරීමට යොදාගත් ප්‍රකාශන දෙකක් හඳුනාගන්න.

**End of Section 1**

| Student/Registration Number | | | | | | | | | | | | Centre Number | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | |

**2007** PUBLIC EXAMINATION

# Sinhala

## Continuers Level

### Section 2: Reading and Responding (30 marks)

**Instructions to Students**

1. Allow approximately 1 hour and 15 minutes for Section 2.
2. Write all your answers to the questions in Section 2 in this booklet in blue or black ink or ball-point pen.
3. You must answer ALL questions in Part A and Part B.
4. Answer Part A in ENGLISH and Part B in SINHALA.
5. Write your student/registration number and the centre number (if required) on the front cover of this booklet.
6. All question booklets will be collected at the end of the examination.

*This examination is used for the HSC (New South Wales), the NTCE (Northern Territory), the SACE (South Australia), the TCE (Tasmania), the VCE (Victoria), and the WACE (Western Australia).*

*© Victorian Curriculum and Assessment Authority 2007*

**Part A** (Questions 6–7)
(20 marks)

---

*When judging performance in this part, the examiner(s) will take into account the extent to which the student demonstrates the capacity to:*

- *understand general and/or specific aspects of texts, by, for example, comparing, contrasting, summarising, or evaluating, and convey the information accurately and appropriately.*

---

6. Read the text and then answer in ENGLISH the questions that follow.

## ඇසළ පෙරහැර

වාර්තාකරු නිමල් සිල්වා

ශ්‍රී ලංකාවේ වාර්ෂිකව ඉතා ඉහළින් පවත්වන ඇසළ පෙරහැර ලෝකයේ වැදගත්ම සංස්කෘතික උත්සවයකි. දීර්ඝ ඉතිහාසයක් ඇති මෙම පෙරහැර, ආරම්භ වුයේ, දළදා වහන්සේට ගෞරව කිරීමටත්, රටේ ගොවිතැනට අවශ්‍ය වර්ෂාව ලබා ගැනීම සඳහා සෙත් පැතීමටත්ය.

අන්තර්ජාතික වශයෙන් ඇසළ පෙරහැර ලබා ඇති කීර්තිය හා ප්‍රසිද්ධිය අවුරුදු පතා මෙය නැරඹීමට පැමිණෙන සංචාරකයින්ගේ සංඛ්‍යාවෙන් පැහැදිලි වේ. ඇසළ පෙරහැර කලා සංදර්ශනයක් ලෙස සැලකිය හැකියි. එහි විවිධ සිංහල නැටුම් ක්‍රම, බෙර වාදන, ජන ගී පමණක් නොව දෙමළ ජනතාවට ආවේණික නැටුම් හා වාදන ද ඇතුළත්වේ. පෙරහැර හා සම්බන්ධ බොහෝ චාරිත්‍ර බෞද්ධ හා හින්දු ආගම් වලට අනුව සිදු කෙරෙයි.

දිය වඩන නිළමේතුමා පවසන පරිදි "මෑත කාලයේ සිට පෙරහැර එම මට්ටමින්ම පවත්වා ගෙන යෑමට අපහසු තත්ත්වයක් උදාවී ඇත. පරම්පරාවලින් පැවතෙන නැටුම්වලට සහභාගිවීම සඳහා තරුණයෝ කැමැත්තක් නොදක්වති. වෙනත් රැකියාවල යෙදී සිටින කලා කරුවන්ට පුහුණුවීම් ආදී කටයුතුවලට සහභාගී වීමට අවස්ථාවක් ද නොලැබේ.

පෙරහැරට සහභාගී වන අලි ඇතුන් සංඛ්‍යාව ද දැන් අඩකින් පමණ අඩුවී ඇත. පෙරහැර සඳහාම පුහුණු කරණ ලද වයස්ගත ඇතුන් කිහිප දෙනෙක්ම මෑතකදී මිය ගියහ. සමහර ඇතුන් අයිතිකරුවෝ තම ඇතුන්ව පෙරහැරට සහභාගී කරවීමට වැඩි මිලක් අයකරති. එපමණක් නොව දළදා කරඬුව වැඩම කරවීම පුහුණු කිරීමට විශේෂ ශරීර ලක්ෂණ ඇති ඇත් පැටවුන් සොයා ගැනීමද අද අපහසුවී ඇත.

කෙසේ නමුත් අප ගෙය කඩාවැටීමට පෙර වහළ අළුත් වැඩියා කරගත යුතුසේ අපේ වටිනා දේවල් ආරක්ෂා කරගත යුතුයි.

QUESTIONS

| | | Marks |
|---|---|---|
| (a) | What are the historical origins of Esala Perahara in Sri Lanka? | **2** |
| (b) | Explain why Esala Perahara attracts a wide range of local and international visitors. | **2** |
| (c) | What challenges do the organisers of this event currently face? | **3** |
| (d) | Explain the meaning of the underlined figure of speech in the last line **and** explain its relevance to the text. | **3** |

7. Read the text and then answer in ENGLISH the questions that follow.

## අපේ වන සම්පත

දයා පෙරේරා

අද අප මුහුණ පා ඇත්තේ විශාල ජල අර්බුදයකටයි. එයට හේතුව කලට වේලාවට වැස්ස නොලැබීම යයි ඉතා කෙටියෙන් පැවසුවත්, තව කරුණු බොහොමයක් ඒ හා සම්බන්ධව පවතී. වර්ෂාව අඩුවීමට ප්‍රධාන හේතුව කැලෑ කැපීම බව පිළිගෙන ඇත. විශාල ගස්වල මුල් මගින් පොලවේ යට පසෙන් උරාගන්නා ජලය වාෂ්පකර හැරීමේ වැදගත් කාර්යය සිදුකරයි. වැහි වළාකුළු සෑදීමට ජල වාෂ්ප ඉතා අවශ්‍යය. ගස් කපා දැමීමෙන් ඉහත කාර්යය නවතියි. එය වර්ෂා හිඟයට හේතුවේ. දැනට මෙම තත්ත්වය ගොවිතැනට තදින්ම බලපා ඇත.

කැලෑ කැපීම නිසා මුහුණ පෑමට සිදුවන තවත් අනතුරක් නම් කඳු නාය යෑමයි. එයින් සිදුවන ජීවිත හානිය හා දේපල හානිය කිව නොහැකි තරම්ය. තවද කැලෑ එළි කිරීම නිසා එහි වසන සතුන්ටද ජීවත්වීමට නොහැකිවීමෙන් සමහර සත්ව වර්ග වඳ වෙමින් පවතී. අලි ඇතුන් වැනි විශාල සතුන්ට උන්හිටි තැන් නැති වීම නිසා ගම් වලට කඩා වැදීම නිසා අලාභ හානි සිදුවේ. හරිත වායුවක් වන කාබන්ඩයොක්සයිඩ් වායුව උරාගැනීමෙන්, ගස් කොලන් වලින් පරිසරයට කරන උපකාරය නැතිවී යෑමද විශාල පාඩුවකි.

මෙතරම් වටිනා වන සම්පත මිනිසා විසින් විනාශ කිරීමට පියවර ගෙන ඇත්තේ මන්දැයි සොයා බැලීම වටී. වැඩිවන ජනගහනයට ජීවත්වීමට ඉඩ අවශ්‍යයය. ඔවුන්ගේ ගෙවල් සාදාගැනීමටත්, බඩු මුට්ටු සෑදීමටත් ලී අවශ්‍යවේ. මිනිසාගේ පදිංචිය සමග පාරවල් සෑදීම, වෙනත් ගොඩනැගිලි ඉදිකිරීම් වැනි කටයුතු ද ඇරඹේ. මෙම අවශ්‍යතාවයන් සම්පූර්ණ කිරීමටත්, අනෙකුත් සංවර්ධන කටයුතු සඳහාත්, කැලෑ එළි කිරීමට සිදුවේ. මේ අතර, ආර්ථික වාසි සඳහා, කිසිම සැලසුමක් නොමැතිව කැලෑ කැපීමද සිදුකෙරේ.

කැලෑ කැපීමේ භයානක ප්‍රතිඵලවලට දැන් අපට මුහුණ දීමට සිදුවී ඇත. මෙය එක් රටකට හෝ ජාතියකට පමණක් බලපාන ප්‍රශ්නයක් නොවේ. අද මුළු ලෝකයේම දේශගුණික තත්ත්වයන් වෙනස් වෙමින් පවතී. එමනිසා වන සම්පත සංරක්ෂණය කිරීම පිළිබඳව නිසි පියවර ගැනීම අප කාගෙත් යුතුකමක් වී ඇත.

QUESTIONS

**Marks**

(a) Describe the role played by the trees in the formation of rain clouds. **2**

(b) Find evidence from the text to support the statement 'the clearing of forests has affected life on earth'. **3**

(c) Explain how the increase in population resulted in the clearing of the forests. **3**

(d) What is the major impact of the clearing of the forests **and** what steps should be taken to resolve the problem? **2**



PLEASE TURN OVER

**Part B** (Question 8)
(10 marks)

---

*When judging performance in this part, the examiner(s) will take into account the extent to which the student demonstrates the capacity to:*

- *understand general and specific aspects of a text by identifying, analysing, and responding to information;*
- *convey information coherently (structure, sequence, accuracy and variety of vocabulary and sentence structure) and appropriately (relevance, use of conventions of the text type).*

---

8. Read the text and then answer the question in 150–200 words in SINHALA on page 7.

<u>දැන්වීමයි</u>

'ලක් ජීවක'

(සෑම දරුවෙකුටම සමාන සනීප ආරක්ෂාව, අධ්‍යාපනය සහ රැකවරණය)

ඔස්ට්‍රේලියානු හා ශ්‍රී ලාංකික වෘත්තිකයන්ගෙන් යුත් අප සංගමය මගින්, සුනාමියෙන් අවතැන්වූ දරුවන්ට, අධ්‍යාපන කඳවුරු කිහිපයක් ශ්‍රී ලංකාවේ පැවැත්වීමට නියමිතය. එහි තම කැමැත්තෙන් සේවය කිරීමට අප හා එක්වන ලෙස තරුණ ඔබට ආරාධනා කරමු.

තේමාව :- අවතැන්වූ දරුවන්ගේ අධ්‍යාපනය සහ සෞඛ්‍යය නඟාසිටුවීම

ස්ථාන :- ගාල්ල / මාතර / හම්බන්තොට

කාල සීමාව :- 2007 දෙසැම්බර සිට 2008 මාර්තු දක්වා

අපි ඔබට ගුවන් ප්‍රවේශ පත්‍ර, නවාතැන් පහසුකම්, ආහාර පාන සපයා දෙනු ලබන අතර මාසිකව $100 දීමනාවක් ද, කඳවුරු වලට යැවීමට පෙර, සතියක පුහුණුවක් ද ලබා දෙමු.

කාර්ය භාරය :- අධ්‍යාපනික සහ සෞඛ්‍ය වැඩ සටහන් වලදී කණ්ඩායම් නායකයාට සහාය වීම

අවම සුදුසුකම :- 12 වසර විභාගය අවසන් කිරීම

වෙනත් දක්ෂතා :- පරිගණක පිළිබඳ දැනුම
ඉංග්‍රීසි සහ සිංහල භාෂාවන් කථා කිරීමේ, කියවීමේ සහ ලිවීමේ හැකියාව
කණ්ඩායම් හැඟීම
අවශ්‍ය වුවහොත් කාර්යාල වේලාවෙන් පසුවද වැඩ කිරීමේ හැකියාව

සම්බන්ධීකරණ නිලධාරි
ලක් ජීවක ව්‍යාපෘතිය

QUESTION

Write a formal letter to the Coordinating Officer giving your details and persuading him or her with supporting evidence that you have the qualifications and skills necessary for this position.

ඉහත සඳහන් දැන්වීමට ඔබගේ විස්තර සඳහන් කර, ඔබට ඇති සුදුසුකම් හා දක්ෂතාවයන් ද තහවුරුකරමින්, ඔබව මෙම තනතුරට තෝරා ගැනීමට පොළඹවන සේ, විධිමත් ලිපියක් සම්බන්ධීකරණ නිලධාරියා වෙත ලියන්න.

*Do not remove this page from the question booklet.*

Student/Registration Number

Centre Number

Sinhala Continuers Level

Question 8



PLEASE TURN OVER

**End of Section 2**

Student/Registration Number | | | | | | | | | | | Centre Number | | | | | | |

**2007 Public Examination**

# Sinhala

## Continuers Level

### Section 3: Writing in Sinhala (15 marks)

**Instructions to Students**

1. Allow approximately 45 minutes for Section 3.
2. Write your answer to a question from Section 3 in this booklet in blue or black ink or ball-point pen. Space is provided for you to make notes.
3. You must answer ONE question in SINHALA.
4. Write your student/registration number and the centre number (if required) on the front cover of this booklet.
5. All question booklets will be collected at the end of the examination.

*This examination is used for the HSC (New South Wales), the NTCE (Northern Territory), the SACE (South Australia), the TCE (Tasmania), the VCE (Victoria), and the WACE (Western Australia).*

© *Victorian Curriculum and Assessment Authority 2007*

**Section 3** (Questions 9–12)
(15 marks)

---

*When judging performance in this section, the examiner(s) will take into account the extent to which the student demonstrates:*

- *relevance and depth of treatment of ideas, information, or opinions;*
- *accuracy and range of vocabulary and sentence structures;*
- *the capacity to structure and sequence response and capacity to use conventions of the text type.*

---

Answer ONE question from this section in 200–250 words in SINHALA.

9. Write a report for a weekend newspaper evaluating the advantages and disadvantages (at least two points from each category) of tourism to Sri Lanka.

   ශ්‍රී ලංකාවට සංචාරක කර්මාන්තයෙන් වන වාසි සහ අවාසි පිළිබඳ (අවම වශයෙන් එක් අංශයකින් කරුණු දෙක බැගින් සඳහන් කර) ඇගයීමක් කරමින්, සති අන්ත පුවත් පතකට වාර්තාවක් ලියන්න.

10. Write several journal entries reflecting on significant events that happened during your work experience.

    ඔබගේ වැඩ පුහුණු කාලය තුළදී සිදුවූ වැදගත් සිදුවීම් පිළිබිඹු කරමින් දින සටහන් කිහිපයක් ලියන්න.

11. Write an informative leaflet for a museum about a person or place of historical importance in Sri Lanka.

    කෞතුකාගාරයේ තැබීම සඳහා, ශ්‍රී ලංකාවේ ඓතිහාසික වශයෙන් වැදගත්වන පුද්ගලයකු හෝ ස්ථානයක් පිළිබඳ තොරතුරු විස්තර කෙරෙන පත්‍රිකාවක් ලියන්න.

12. Write an imaginative short story based on the saying ‘Every cloud has a silver lining’.

    ‘සෑම අඳුරු වලාකුළකම රිදී රේඛාවක් ඇත’ යන කියමන මාතෘකා කරගෙන මනඃකල්පිත කෙටි කතාවක් ලියන්න.

You may make notes in this space.

Question Number:

**End of Section 3**